2027 වර්ෂය සඳහා වෙළඳපල මිල සැදැහුම් (Shopping Method) යටතේ
සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිකිරීම සඳහා පොදු උපදෙස් හා කොන්දේසි

නාගරික සංවර්ධන අධිකාරිය

1. 2027 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත වෙළඳපල මිල සැදැහුම් (shopping Method) යටතේ භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි, නාගරික සංවර්ධන අධිකාරියේ ‘‘වෙබ්‘‘අඩවිය හරහා 2026.11.04 දින සිට 2026.11.20 වන දින දක්වා කාලය තුල අයකිරීමකින් තොරව ලබාගත හැකිය.(Download).

2. සැමවිටම නිවැරදි තොරතුරු පමණක් සපයන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සපයා ඇති කවර හෝ තොරතුරක් සාවද්‍ය බවට හෝ කවර හෝ වැදගත් තොරතුරක් ලබාදීමෙන් වැලකී සිටින බවට පෙනීයන්නේනම් එවැනි අයදුම්කරුවකු ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබනු ඇත. අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.අයදුම්පතට ඇමිණිය යුතු සියලු ලිපි ලේඛන අනුක්‍රමිකව අංකනය කළ යුතුය. මුළු පිටු සංඛ්‍යාව ප්‍රධාන අයදුම්පතෙහි දකුණු පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව සඳහන් කලයුතුය.

අයදුම්පත සමග අමුණා එවිය යුතු ලිපිලේඛණ පහත සඳහන්වේ.

අ. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ/සමාගම් ලියාපදිංචිකිරීමේ සහතිකයේ පිටපතක්

ආ. <u>සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් වැඩ</u> **සඳහා ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) කුමන විශේෂිත කාණ්ඩයක්/ශ්‍රේණියක් යටතේ අවසන්වරට ලියාපදිංචිවී ඇතිද යන්න තහවුරුකිරීම සඳහා එම සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.**

ඇ. **ලියාපදිංචිවීම සඳහා අයිතම ගාස්තු ගෙවන ලද මුදල් තැන්පතු පත්‍රිකාවේ/කුවිතාන්සියේ <u>මුල් පිටපත</u> අනිවාර්යයෙන් ඇමිණිය යුතුය.**

ඈ. ලියාපදිංචිවී ඇති පුද්ගලයන් "වැට්"බදුසහතිකයේ පිටපතක් ඉදිරිපත් කල යුතු වේ.

4. විධිමත් පරිදි සම්පූර්ණ කරනලද අයදුම්පත් අවශ්‍ය සියලු ලිපිලේඛන සහිතව ආවරණ ලිපියක් මගින් පහත සඳහන් ලිපිනයට **2026.11.20** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑල මගින් හෝ ගෙනවිත් භාරදිය යුතුය. අයදුම්කරුවන් විසින් අයදුම්පත් බහාලු ලියුම්කවරයේ වම්පස ඉහළ කෙලවරේ **‘‘සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027’’** යනුවෙන් සඳහන් කල යුතුය.

නාගරික සංවර්ධන අධිකාරිය,
ප්‍රසම්පාදන ඒකකය,
7 වන මහල,
‘‘සෙත්සිරිපාය’’
බත්තරමුල්ල.

අයදුම්කරුවන් සඳහා පොදු උපදෙස්

5. ප්‍රශ්නයක් ඉදිරියෙහි ඊට උචිත ආකාරයට ‘‘ඔව්‘‘/‘‘නැත’’ යන්න, පැහැරහැරීමකින් තොරව කපා දමන්න.
6. කරුණාකර අයදුම්කරුට අදාළ නොවන කවර හෝ අයිතමයක් ඉදිරියෙන් ‘‘අ/නෝ‘‘ (අදාළ නොවේ) යන්න සඳහන් කරන්න.

7. ලියාපදිංචිකිරීමෙන් පසුව යම් සමාගමක/ආයතනයක තැපැල් ලිපිනයෙහි යම් සංශෝධනයක් හෝ වෙනසක් සිදුවුවහොත්, එම ඉල්ලීම සලකා බලනු ලබනුයේ එම ඉල්ලීම සමග එකී සංශෝධනයට සම්බන්ධ අදාළ සමාගම/ආයතනය මගින් නිකුත් කරන ලද සංශෝධිත සහතිකයෙහි සත්‍ය පිටපතක් ඉදිරිපත් කිරීමෙන් පමණි.

8. ***<u>ලියාපදිංචි කිරීමෙන් පසුව කවර කරුණක් යටතේ හෝ අයිතම වර්ගයෙහි කිසිදු වෙනසක් සිදුකල නොහැකි බව හා අයිතම අතර මාරුකිරීම්ද සිදුනොකරන බව සලකන්න.</u>***


9. **අයදුම්කරුගේ යම් ප්‍රමාද දෝෂයක් හෝ අනවධානය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වගකීම භාරගනු නොලැබේ.**

10. **එක් අයිතමයක් සඳහා ලියාපදිංචිකිරීමේ ගාස්තු වශයෙන් රු. 1,200.00 මුදලක් අයකරනු ලැබේ. (2.5% (සමාජ ආරක්ෂණ බද්ධ) සහ 18% (එකතු කල අගය මත බද්ධ) ඇතුළුව)**

එක් අයදුම්කරුවෙකුට අයිතම කිහිපයක් සඳහා ඉල්ලුම් කල හැක. අයිතම ලියාපදිංචි කිරීමේ ගාස්තු ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 1534 දරණ ගිණුමට බැර වන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගෙවීම හෝ නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත්/දිස්ත්‍රික් කාර්යාලයකට ගෙවීම කල හැක.

<u>සැ.යු. - අයිතමයක් ලෙස සලකණු ලබන්නේ අයිතම ලැයිස්තුවෙහි (Item List) එක් ඉංග්‍රීසි අකුරක් සමඟ ඉලක්කමක් යටතේ දක්වා ඇති අයිතමයක් වේ. (උදා: A1 එක් අයිතමයකි,A2 එක් අයිතමයකි, A3 එක් අයිතමයකි ආදී වශයෙන්)</u>

11. අයිතම ගාස්තු අදාළ ලංකා බැංකු ශාඛාව හරහා ගෙවන්නේනම්, අයදුම්කරුවන් විසින් පහත සඳහන් අකෘතිය ආකාරයට **මුදල් තැන්පතු පත්‍රිකාව** පුරවා, එම ගාස්තු අදාළ බැංකු ශාඛාව වෙත ගෙවිය යුතුවේ.අයිතම ගාස්තු නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය,පළාත්/දිස්ත්‍රික් කාර්යාලයකට ගෙවන්නේනම් අයදුම්කරුවන් විසින් එම ගාස්තු ගෙවීමෙන් පසු ප්‍රධාන කාර්යාලය, අදාළ පළාත්/දිස්ත්‍රික් කාර්යාලය විසින් නිකුත් කරන කුවිතාන්සිය ලබාගත යුතුවේ.


BANK OF CEYLON
Bankers to the Nation
මුදල් තැන්පතු පත්‍රිකාව
පණ වෛප්පුச් சீட்டு Cash Deposit Slip
දිනය / திகதி / Date 01 10 2025
ගිණුම්/කාඩ්පත් අංකය கணக்கு/அட்டை இலக்கம் Account/Card Number 1534
ගිණුම්/කාඩ්පත් හිමියාගේ නම සහ ලිපිනය : නාගරික සංවර්ධන අධිකාරිය
කණක්කු/அட்டை வைத்திருப்பவரின் பெயரும் முகவரியும் : 7 මහල,
Account/Card Holder's Name and Address : "රසුන්කිරිතාය",
බන්නර්ගුල්ල.
ගිණුම්/කාඩ්පත් හිමියා නොමැතිව වෙනත් පාර්ශවයක් විසින් කරන රු. 200,000ට වැඩි මුදල් තැන්පතු සඳහා
கணக்குரிமையாளர்/அட்டை வைத்திருப்பவர் அல்லாது மற்றவர்களால் மேற்கொள்ளப்படும் 200,000/- இற்கு அதிகமான வைப்புகளுக்கு
For cash deposits above Rs. 200,000 deposited by Person other than A/C Holder/Card Holder
තැන්පත් කරන්නාගේ නම සහ ලිපිනය /வைப்புச் செய்பவரின் பெயரும் முகவரியும் Depositor's Name and Address
ඒ. බී. කේ. කුමාරගම
ගාලු පාර, කොළඹ 03
ජා.හැ.ප/ගමන් බලපත් / பියதුරු බලපත් අංකය
தே.அ.அ./கடவுச்சீட்டு/சாரதி அனுமதிப்பத்திர இல./ N.I.C / P.P / D. L No.:
දුරකථන අංකය / தொலைபேசி இல./ Telephone No:
තැන්පතුවේ අවශ්‍යතාවය / வைப்பின் நோக்கம் / Purpose of Deposit: සංඝයුන් නාරුමන් ලියාපදිංචිය 2026
Ref No.
තැන්පත්කරුගේ අත්සන / வைப்புச்செய்பவரின் ஒப்பம் / Depositor's Signature
පරිගණක මුද්‍රිත හෝ නිල අත්සන් ඇත්නම් මුලංගුයි / கணினி அச்சீடு அல்லது அதிகார ஒப்பம் இருப்பின் செல்லுபடியாகும்/Valid Computer Print or Authorised Signature

නෝට්ටු தாள்கள் Notes	රුපියල් / ரூபா / Rs.			ශත சதம் Cts.
5000/-				
2000/-				
1000/-	X 1	1	000	00
500/-				
200/-				
100/-	X 2		200	00
50/-				
20/-				
10/-				
කාසි நாணயங்கள் Coins				
එකතුව மொத்தம் Total		1	200	00

Validation checked

Signature

BOC/SUPP/S242164
Credit 1-2
Form No:70175
Narain Computer Forms - 781123 DJ

12. **2027** වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ වැඩිදුර තොරතුරු අවශ්‍ය වුවහොත් පහත සඳහන් නිලධාරී අමතන්න. **(කාර්යාල වේලාවන් තුල පමණි)**

- **සහකාර අධ්‍යක්ෂ (විගණක) - නාගරික සංවර්ධන අධිකාරිය**

  සෘජු දුරකථන අංකය – 011 2873649

- **වී. ජී. ඩී. පෙරේරා**

  011 2797200 011 2872649 011 2873644

  011 2873647 011 2873651 011 2875333 } දිගුව - **2680 / 2681** හා **2682**

13. **සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය** විසින් පත්කරනු ලබන නිලධාරීයෙකු විසින් සියලු අයදුම්පත් සලකා බලන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පමණක් ලියාපදිංචි කෙරේ. අවශ්‍ය සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණකොට නොමැති සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. **2026 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලද සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි ලේඛණය, 2027 වර්ෂයට අදාළ සැපයුම්කරුවන්ගේ/කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛණය නිකුත් කල පසු අවලංගු වේ.**

15. **2027 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.**

අධ්‍යක්ෂ ජනරාල්
නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය
ප්‍රසම්පාදන ඒකකය,
7 මහල,
''සෙත්සිරිපාය''
බත්තරමුල්ල.

2026 නොවැම්බර් මස 02